# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය

# පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුර පිරවීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවේ ලේකම් තනතුර (HM 1-1)

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත විසින් නියමිත කර ඇති පරිදි, පාරිභෝගික කටයුතු සභාවේ එදිනෙදා කටයුතුවල සමස්ථ පරිපාලනය කිරීම, සියලුම සභා වාර්තා සහ අනෙකුත් වාර්තා සටහන් පවත්වා ගැනීම.

විමර්ශණය සඳහා යොමුකරනු ලැබ ඇති සියලුම කරුණු කාරණා සම්බන්ධ දැන්වීම් හා නිගමනයන් සකස් කර, බෙදහැරීම, සභාවේ විමර්ෂණයන් හා විභාග කිරීම් අරමුණු සඳහා, සභාවට අවශ්‍ය වන සියලු සාක්ෂි පිළියෙල කිරීම, සකස් කිරීම හා ලබාගැනීම. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා වෙනත් ආයතන හා සමග සභාවේ විමර්ෂණ හා විමසීම් අරමුණු සඳහා සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම.

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්** : නීතිඥවරයෙකු වීම සහ පශ්චාත් උපාධි සුදුසුකම් සමග නීතිඥවරයකු ලෙස දිවුරුම් දීමෙන් පසු සංස්ථාවක මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ සමාගම් ලේකම්වරයෙකු හෝ ව්‍යවස්ථාපිත සභාවක හෝ නියාමන ආයතනයක ලේකම්වරයෙකු ලෙස වසර 15 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්** : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරන කාණ්ඩයේ (MM 1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවය.

**වැටුප් පරිමාණය** : **HM 1-1 2016**

රු. (81,670 - 15X2,270-115,720) DMS චක්‍රලේඛ අංක 02/2016 පරිදි

**වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

**ප්‍රවාහන හා ඉන්ධන දීමනාව** : නිල රථයක් භාවිතා කිරීමට හෝ මාසිකව රු. 50,000/= ක ප්‍රවාහන දීමනාව සහ ලීටර් 120 ක ඉන්ධන දීමනාව, ලැබීමට හිමිකාරිත්වය ඇත.

**පොදු කොන්දේසි :**

**දීමනා** : ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව, වෘත්තීයවේදී දීමනාව සහ වෙනත් අදාළ දීමනාවන් අදාළ රජයේ චක්‍ර ලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය** : තනතුර ස්ථිර වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය හිමිවන අතර, අදාළ රජයේ චක්‍රලේඛවල ප්‍රතිපාදන / විධිවිධානවලටද හිමිකාරිත්වය ලැබෙනු ඇත.

**බඳවා ගැනීමේ වැටුප :** බාහිරව බඳවා ගනු ලබන පුද්ගලයින් වැටුප් පරිමාණයේ මූලික පියවරෙහි / තලයෙහි පිහිටවනු ලබනු ඇත. අභ්‍යන්තරව බඳවා ගනු ලබන පුද්ගලයින්ගේ වැටුප, ආයතන සංග්‍රහය -1හි VII වන පරිච්ඡේදයේ විධිවිධාන / ප්‍රතිපාදන පරිදි තීරණය කරනු ලැබේ.

**සේවයේ ස්ථිර කිරීම** : බඳවා ගනු ලබන අයවළුන් වසර තුනක (3) පරිවාස කාල සීමාවකට අපේක්ෂකයින් පත්කරනු ලැබේ. ඔහු /ඇය එම පරිවාස කාලසීමාව තුළ ඉටුකරනු ලබන සතුටුදායක කාර්ය සාධනය හා හැසිරීම මත තනතුරෙහි ස්ථිර කරනු ලබනු ඇත. දැනටමත් තනතුරක ස්ථිර සේවයේ සිටින අභ්‍යන්තරව තෝරාගනු ලබන අපේක්ෂකයින් එක් වසරක වැඩබලන කාලසීමාවකට යටත් කරනු ලබනු ඇත.

**බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය :**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වෙනත් කරුණු :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටු කිරීමට හැකි වන අන්දමට කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- අනර්ඝ හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත පහත ලිපිනයට ස්වකීය අයදුම්පත් ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් සමග අදාළ සහතික පත්‍රවල පිටපත් සුදුසුකම් සනාථ කිරීමේ ලේඛනගත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනෙන් පසුව ලබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කවර ආකාරයෙන් අනිසි බලපෑම් කිරීමට උත්සාහ දැරීම නුසුදුසුකමක් වනු ඇත. අයදුම් කරනු ලබන තනතුර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. ඔබගේ අයදුම්පත් පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**2 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**

Source: Dinamina, Daily News (2020.06.23)